**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂවලට අදාළව ලැබිය යුතු රු.8,493,508 ක ප්‍රාග්ධන ආධාර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

(ආ) ඉකුත් වර්ෂවල වැඩිපුර ගිණුම් ගතකර තිබූ රු.86,981 ක් වූ ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේ දී සංවර්ධන සංචිත ගිණුම හර කර, සමුච්චිත අරමුදල බැර කිරීම නිසා සමුච්චිත අරමුදල් ගිණුම රු.173,962 කින් වැඩියෙන් පෙන්නුම් කෙරුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී ලබාගත් අත්තිකාරම් ගිණුම් ගත කිරීමේ දී සිදු වී තිබුණු වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේ දී වර්ෂයේ වියදම් රු.37,560 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව වෙන්දේසි කිරීමට නියම වූ රු.625,000 ක්වූ කැබ් රථය සහ රු.400,000 ක් වූ ට්‍රැක්ටරය වෙන්දේසි කර නොතිබිය දී, පොත්වලින් ඉවත් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී රු.62,103 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.80,540 ක් වූ විනෝද බදු වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.64,013 ක් වූ දේපල ණය පොලී වෙනුවෙන් රජයේ දායකත්වය, ලැබියයුතු ආදායම් ආධාර ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.37,343,997 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, අසමානතා වල එකතුව රු.20,584,036 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**ගෙවිය යුතු ගිණුම්**

(අ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා ගෙවිය යුතු ණය වාරික හා පොලී ගෙවා, ගිණුම් පියවීමෙන් තොරව එක් එක් වර්ෂයට අදාළ ණය වාරිකය වෙනත් ණයහිමියන්ට ද, පොලිය වියදම් ණයහිමියන්ට ද මාරුකර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුළු මුදල රු.12,486,105 ක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) සභාවේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,404,378 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව පැවතුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,725 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | - | අයවැය සමග අය හා වැය විෂයයන් සසඳා, අතිරික්ත හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශයක් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 102, සිට110 | නැතිවීම්, හානිවීම් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාව සතු වාහන 18 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,397,787 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,546,679 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සභාවට අයත් ජංගම ගිණුම් 03 ක සාමාන්‍ය මාසික ශේෂයන්හි එකතුව රු.4,754,888 ක් වූ අතර, අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීමෙන් සභාවට ලබා ගැනීමට හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 38,040 | 40,676 | 26,218 | 199,570 | 38,000 | 40,506 | 70,838 | 185,112 |
| ii. | කුලී | 361,800 | 3,752,040 | 3,750,540 | 17,500 | 3,648,000 | 3,568,863 | 3,569,113 | 23,000 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,095,000 | 521,864 | 554,314 | 74,950 | 1,075,000 | 433,210 | 562,460 | 107,400 |
| iv. | වෙනත් ආදායම් | 68,297,300 | - | 38,278,121 | - | 45,588,600 | - | 36,551,514 | - |
| | | 69,792,140 | 4,314,580 | 42,609,193 | 292,020 | 50,349,600 | 4,042,579 | 40,753,925 | 315,512 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.69,792,140 ක් ද, බිල්කල ආදායම රු.4,314,580 ද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.42,609,193 ක් ද වූ අතර, වර්ෂ අවසානයට වූ හිඟ ආදායම රු.292,020 ක් විය.

**2.3.3 වරිපනම් බදු**

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**2.3.4 අක්කර බදු**

------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාළව අයකරගත යුතුව තිබුණු රු.225,788 ක් වූ අක්කර බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ සියයට 89 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.199,570 ක් වී තිබුණි.

**2.3.5 කුලී**

-----

ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.3,390,240 ක් වැඩිපුර බිල්කර තිබුණු අතර, හිඟ ශේෂයෙන් හා බිල්කළ අගයෙන්, අයකිරීම් සියයට 99 ක් විය.

**2.3.6 බලපත්‍ර ගාස්තු**

---------------

ඇස්තමේන්තු අගයට වඩා රු.573,136 ක් අඩුවෙන් බිල් කර තිබුණු අතර, රැස්කිරීම් රු.554,314 ක් වීමෙන් අයකිරීම් සියයට 100 ක් විය.

**2.3.7 ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු**

-------------------------------

සමාලෝචිත වර්ෂ අවසානය වනවිටත් අය නොවී පැවති රු.74,950 ක ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.13,798,980 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.1,382,243 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යයසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

----------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2016 ඔක්තෝබර් 16 දින ලැබී තිබුණු රු.1,000,000 ක් කිසිදු සංවර්ධන කාර්යයකට නොයොදා 2017 අගෝස්තු 07 දින ආපසු යවා තිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභාව විසින් වෙළෙන්දාව වත්තේ කොම්පෝස්ට් අංගනයක් ඉදිකර තිබුණි. තෝරාගත් දිරන කසළ යොදා නිපදවූ කාබනික පොහොර අලෙවියෙන් රු.133,137 ක් උපයාගෙන තිබූ අතර නොදිරන කසළ, ගබඩා කාමරය තුළ හා කොම්පෝස්ට් අංගනයේ වූ ගොඩනැගිල්ලක් තුළ ගබඩා කර තිබුණි. මෙය කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ස්ථාවර හා සාර්ථක විසඳුමක් නොවූ අතර, නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට, අලෙවි කිරීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට සභාව මෙතෙක් පියවර ගෙන නොතිබුණි. කසළ කළමනාකරණ භූමියට ලබා දී තිබූ පරිසර බලපත්‍රය 2017 ජනවාරි 02 දින අවසන් වී තිබූ අතර, මධ්‍යම පරිසර අධිකාරිය මඟින් දෙන උපදෙස් පරිදි කටයුතු කර 2017 වර්ෂය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ කැලි කසළ ප්‍රතිචක්‍රීකරණයට හා ගොවිපොලක් පවත්වාගෙන යාම සඳහා අක්කර 13 කුත්, පර්චස් 23.83 ක් වූ වෙළෙන්දාව වත්ත භුක්ති විඳීමේ පදනම මත ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේදී අක්කර ½ ක කුරුඳු වගාවේ අස්වනු බදු දී නොතිබුණි.

(ii) අක්කර 1 ක තිබූ කෙසෙල් වගාව නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ආදායම පහළ ගොස් තිබුණි.

(iii) අක්කර 4 ½ ක් වූ පොල් වගාව අත්පත් කර ගන්නා අවස්ථාවේ වූ පොල් ගස් 57 හැර නව වගාවන් ආරම්භ කර නොතිබුණු අතර, පවත්නා වගාව සඳහා පොහොර යොදා අස්වනු වර්ධනය කර ගෙන නොතිබුණි.

(iv) අතුරු භෝග වගාව සඳහා වෙන් වූ භූමි භාගය නිසි ලෙස වගාවට යොදා නඩත්තු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව එක් ගිණුමකින් තවත් ගිණුමකට මාරු කල මුදල් පියවීමේ දී එය ආදායමක් ලෙස හඳුනා ගැනීම නිසා නිර්මාණය වූ රු.679,696 ක් වූ ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 05 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එන එකතුව රු.365,116 ක් වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවකයින් දෙදෙනෙකුගේ දේපල ණය පොලී ලෙස සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබූ එකතුව රු.64,013 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

ස්ථාන මාරු වී ගිය, සේවය හැර ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.112,575 ක් වර්ෂ 03 කටත් අධික කාලයක සිට අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වූ රු.400,000 ක් වටිනා කුබෝටා මිනි ට්‍රැක්ටරය හා රු.625,000 ක් වටිනා මිට්ෂුබිෂි ඩබල් කැබ් රථය භාවිතයට නොගෙන පැවතුණි.

(ආ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රූපවාහිනී යන්ත්‍ර 02 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.5 හඳුනාගත් පාඩු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරික නොගෙවීම නිසා රු.693,022 ක් අමතර මුදලක් පොලී ලෙස ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සභාව විසින් 2006 ජනවාරි සිට 2010 දෙසැම්බර් දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට යැවිය යුතු තොරතුරු හා දායක මුදල් නොයැවීම මත රු.141,719 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධ වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන කටයුතු කර නොතිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

-------------

### 3.6.1 සැපයීම් හා සේවා

---------------------

රු.143,684 ක් වූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

## 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.27,188,374 ක් වූ අතර, එම වටිනාකම සියයට 20 සිට සියයට 46 අතර පරාසයක විය.

(ආ) වියදම් විෂයයන් 08 ක එකතුව රු.35,706,401 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 27 සිට සියයට 96 අතර පරාසයක පැවැතුණි.

(ඇ) පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද දීමනා ගෙවීම් ඇස්තමේන්තුගත අගය ඉක්මවා රු.9,951,303 ක් ගෙවා තිබූ අතර, එය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 1,856 ක අගයක් විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකක දී අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | නොවෙනස්ව ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර වෙනස්කම් පැවැතුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම. |
| | | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (iii) | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | (i) | ආදායම් විෂයයන් 06 ක ඉලක්කගත ආදායම් උපයාගෙන නොතිබුණි. |
| | | (ii) | එක් වැය විෂයයක ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වැයකිරීම් සිදුකර තිබීම. |
| (ඇ) | ලේඛන නඩත්තු කිරීම | (i) | සභාව විසින් වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | හානි පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර, පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (iv) | පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | ආදායම් රැස්කිරීම | (i) | සභාවේ සේවය කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (iii) | මුද්දර ගාස්තු ආදායම යාවත්කාලීනව අය කරගෙන නොතිබුණි. |
| | | (iv) | වරිපනම් කළාප ප්‍රකාශ කර, බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |